# සාකච්ඡා අවශ්‍ය නැත - එක්සේසත් රාජ්‍යය

පසුගිය සතියේ ගෝඨාභය රාජපක්ෂ මහතා වැදගත් ප්‍රකාශයක් කර තිබුණි. ඒ මහතා කියා ඇත්තේ දේශපාලන විසඳුමක් දීමට පෙර කොටි සංවිධානය පරාජය කළයුතු බව ය. ආරක්ෂක ලේකම්වරයකු එවැනි ප්‍රකාශයක් කළ පළමු අවස්ථාව එය වෙයි. ඒ ප්‍රකාශය පිළිබඳ ව අපි ගෝඨාභය රාජපක්ෂ මහතාට පින් දෙමු. එහෙත් පින් දීම පමණක් ප්‍රමාණවත් වේ යැයි අපි නො සිතමු. විශේෂයෙන් ම කොටි පැරදවීමේ ක්‍රියාවලියේ  නිරතව සිටින ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන්ට හා භටයන්ට අපේ කෘතවේදීත්වය පිරිනැමීම අපි අතපසු කර ඇත්තෙමු.

පදක්කම් හා තෑගි දිනා ආපසු පැමිණෙන ක්‍රීඩකයන්ට, ක්‍රීඩිකාවන්ට හා සිනමා අධ්‍යක්ෂවරුන් ඇතුළු කලාකරුවන්ට දක්වන උපහාර හමුදා භටයන්ට නොදැක්වීම ගැන සියළු දෙනා නැවත සිතා බැලිය යුතු ය. මේ ඇතැම් සිනමාකරුවන්ට ඊනියා ජාත්‍යන්තර තෑගි ලැබෙන්නේ ඔවුන් රටේ ඉතිහාසය, සංස්කෘතිය, අනන්‍යතාව ආදිය කෙළෙසමින් රටේ ස්වෛරීභාවය ද අනතුරට ලක්කරන චිත්‍රපටි නිපදවීම හේතුවෙනි. එවැන්නන් ගැන පත්තර පිටු පුරා ලියන ඇතැම් අඳ බාල (තමතමන් සිතන ආකාරයට නම් මේ පුස්සෝ ප්‍රබුද්ධයෝ වෙති) ජඩමාධ්‍යකරුවෝ (ඔවුන් තමන් හඳුන්වාගන්නේ ජනමාධ්‍යකරුවන් ලෙස ය) රටේ ස්වෛරීභාවය රැකගැනීම සඳහා තම ජීවිත පූජාවෙන් සටන් කරන හමුදා භටයන් ගැන වැඩිම වුවහොත් නිහඬ වෙති. මේ ජඩමාධ්‍යකරුවන් බොහෝවිට කරන්නේ හමුදාව ඊනියා දෙමළ නිජභූමියක් ආක්‍රමණය කර ඇතැයි බෙරිහන්දීම ය.

කොටි සංවිධානය සමග කරන ඊනියා සාම සාකච්ඡාවලින් සිදුවන්නේ කොටින්ට ආයුධ රැස්කරගැනීමට හා ළමුන් ඇතුළු වෙනත් අයට ආයුධ පුහුණුවක් දීම සඳහා අවස්ථාව සපයාදීම පමණ ය. පසුගිය අවුරුදු විස්සක් පමණ කාලයක කරන ලද ඊනියා සාම සාකච්ඡාවලින් සිදු වී ඇත්තේ කුමක් ද? ඒ සාකච්ඡාවලින් අත්කරගත් සාමයක් වේ ද? ඉන් සිදුවූයේ කොටි තව තවත් ශක්තිමත්වීම පමණ ය. එහෙත් පසුගිය මාස දහඅටක පමණ සුළු කාලයක දී කොටි බලය නැගෙනහිර පළාතේ බිඳ දැමීමට හමුදාව සමත් වී ඇත. උතුරේ කොටි බලය එතරම් සුළු කාලයක දී බිඳීමට හැකියයි සිතන්නෝ නො වෙති. එහෙත්  උතුරේ ද කොටි පරාජයකිරීම කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණකි.

කොටි අනභිබවනීය යැයි දෙඩූ ජඩමාධ්‍යකරුවන්, ඊනියා ගැටුම් නිරාකරණය කරන්නන් ඇතුළු විවිධ වර්ගවල ඊනියා ප්‍රබුද්ධයන්ගේ ඩොලර්වලින් වැසුණු හෙළුව කාගේත් දැකගැනීම සඳහා දැන් ප්‍රදර්ශනය වෙයි. මේ කසිකබල් ප්‍රබුද්ධයෝ ද දෙමළ ජාතිවාදීහු වෙති. අද සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍යයක් වෙනුවෙන් ලියන කියන ඕනෑම අයෙක් දෙමළ ජාතිවාදීහු වෙති. සන්ධීය රාජ්‍යයක් පිහිටුවීමේ එකම අරමුණ සිංහලයාට මෙරට හිමි තැන අහිමිකිරීම ය. කසිකබල් ප්‍රබුද්ධයන් කියන ආකාරයට නම් මෙරට ඒකීය රාජ්‍යයක් ඇතිවූයේ බ්‍රිතානීන් 1815 දී රට ගිවිසුමක් මගින් සටකපට ආකාරයට අයත්කර ගැනීමෙන් පසුව ය. එහෙත් ඔවුන් නොදකින කරුණ නම් අවුරුදු දෙදහසකට අධික කාලයක්  මෙරට එක්සේසත් රාජ්‍යයක් ලෙස පැවතුණු බව ය.

පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට ක්වේරොස් වැනි පෘතුගීසි ඉතිහාසඥයන්ට අනුව මෙහි රාජ්‍ය කිහිපයක් විය. එහෙත් ක්වේරොස් පවා පවසන්නේ කෝට්ටේ රජු මෙරට අධිරාජයා වූ බව ය. පෘතුගීසීන් පැමිණෙන විට මෙරට එක්සේසත් රාජ්‍යය දුර්වල ව පැවතුණි. ඒ පිළිබඳ විවාදයක් නැත. එක්සේසත් රාජ්‍යයක ඈපාවරු මාපාවරු ආදීහු සිටිය හ. ඔවුහු රජු වෙනුවෙන් ඒ ඒ ප්‍රාන්ත කරවූහ. ඇතැම් අවස්ථාවල මේ ඈපාවරු (ඒ පදවි නාමයෙන් නොවුවත්, ඇතැම් විට රජු යන නම භාවිතා කරමින්)  බලවත් වූහ. පෘතුගීසීන් මෙරටට පැමිණියේ එවැනි රජවරු කිහිප දෙනකු සිටි සමයක ය.

පෘතුගීසීන්ට එක්සේසත් රාජ්‍යය යන සංකල්පය නො වී ය. ඔවුන් මෙරට දුටුවේ ඔවුන්ට පුරුදු සංකල්ප අනුව ය. ඔවුන් දැනගෙන සිටියේ රජු හා අධිරාජයා (එම්පරර්) යන සංකල්ප ය. පෘතුගීසීන් ඒ සංකල්ප ඔස්සේ මෙරට දැකීම පුදුමයක් නො වේ. අපට මෙහි දී වැදගත්වන්නේ පෘතුගීසීන් ද කෝට්ටේ රජු මුළු රටේම අධිරාජයා ලෙස දැකීම ය. රටට අධිරාජයකු වී යැයි පෘතුගීසීන් සඳහන් කර ඇත්තේ කෝට්ටේ රජුට එකල පවා රට පුරාම විහිදුනු යම් බලයක් තිබූ බැවින් බව පැහැදිලි ය. මේ බලය රාජ්‍යය ගම්පොළ තිබූ අවධියේ ද විය. එකල යාපනයේ ආර්යචක්‍රවර්ති රජු

© Prof. Nalin De Silva

අවුරුදු පතා පඬුරු පඩුක්කම් රැගෙන ගොස් ගම්පොළ රජු හමු වී තමාට රජ යන නාමය යොදාගැනීමට අවසර ගෙන ඇත. පෘතුගීසීන්ගේ වචනවලින් කියන්නේ නම් එකල ගම්පොළ රජු රටේ අධිරාජයා විය.

සිදු වී ඇත්තේ කුමක් ද යන්න පැහැදිලි ය. එක්සේසත් රාජ්‍යයේ ප්‍රාන්තවල සිටියෝ ඈපාවරු හා මාපාවරු ය. එසේ වුවත් එක්සේසත් රාජ්‍යය තරමක් දුර්වල වීම හේතුවෙන් ඔවුන් බලවත් වී රජු යන පදවි නාමය ද යොදා ගෙන ඇත. එහෙත් එසේ කර ඇත්තේ රජුගෙන් (පෘතුගීසීන්ට අනුව අධිරාජයාගෙන්) අවසර ලබාගෙන ය. මෙය තවදුරටත් පෙන්නුම් කරන්නේ අගනුවර හෝ රාජ්‍යය හෝ තිබුණේ එක් නගරයක පමණක් ය යන සංකල්පයෙන් ය. අපි රාජ්‍යය (විචාරීම යන අරුතින්) අනුරාධපුරයෙන් පොළොන්නරුවට ගෙනයෑම ගැන කතාකරමු. එසේත් නැත්නම් රාජ්‍යය දඹදෙනියට කුරුණෑගලට යාපහුවට ගම්පොළට කෝට්ටේ ට ගෙන යෑම ගැන කියමු. එහෙත් අපි කිසි දවසක රාජ්‍යය සීතාවකට හෝ රයිගමට හෝ ගෙනයෑමක් ගැන නො කියමු. සීතාවක හා රයිගම රජවරු වාසය කර ඇත. එහෙත් ඔවුහු රජ යන පදවි නාමය යොදාගත් ඈපාවරු පමණක් වූහ. ඔවුන් ඈපාවරුන්ට වඩා බලවත් වී ඇත්තේ කෝට්ටේ රජු දුර්වල වීම නිසා මිස වෙනත් කරුණක් නිසා නො වේ.

පෘතුගීසීන් මෙරටට එකල නො පැමිණියා නම් කුමක් සිදුවිය හැකිව තිබුණි ද? එක්කෝ මායාදුන්නේ රජු නැත්නම් සීතාවක රාජසිංහ රජු මුළු රටට ම රජු වී ඇතැම් විට රාජ්‍යය සීතාවකට ගෙන යෑමට ඉඩ තිබුණි. නැත්නම් කෝට්ටේ ම රජු වීමට තිබුණි.  ඉතිහාසයේ සිදුවූයේ කුමක් ද යන්න මිස සිදුවන්නට තිබුණේ  කුමක් ද යන්න ඇසීම ශාස්ත්‍රීය නො වේ යැයි පඬිවරයකු අතින් ප්‍රකාශ වීමට ඉඩ ඇත. ඇතැම් විට ඔහු ඒ සඳහා ඊ. එච්. කාර් හෝ වෙනත් යුරෝපීය පඬිවරයකුගෙන් උද්ධෘතයක් ඇද බෑමට ද ඉඩ ඇත. ශාස්ත්‍රීය අශාස්ත්‍රීය යනු අනෙක් සංකල්ප මෙන් ම සාපේක්ෂ සංකල්ප වෙයි. ඉතිහාසයේ කුමක් සිදුවන්නට තිබුණි ද යන්න ඇසීමෙන් ඒ ප්‍රශ්නයට ප්‍රායෝගික වශයෙන් පිළිතුරක් ලබාගත නොහැකි බව කීමට යුරෝපීයයකු අවශ්‍ය නො වේ. පෘතුගීසීන් නැති ලංකාවක රාජසිංහ රජු සීතාවකට රාජ්‍යය ගෙන යෑම ප්‍රායෝගික ව අද දැකගත හැකි නො වේ. එහෙත් ඉහත සඳහන් ප්‍රශ්නය ඇසීමෙන් අපට ඇතැම් සංකල්ප ගැන නිරවුල් අවබෝධයක් ලබාගැනීමට හැකිවෙයි. අපට අවශ්‍ය පෘතුගීසීන්ගේ ඇසින් නොබලා එක්සේසත් රාජ්‍ය සංකල්පය තේරුම් ගැනීම ය. ඕනෑම ක්ෂෙත්‍රයක සෛද්ධාන්තික පඬිවරුන් සිටිය යුතු යැයි මම අදහස් කරමි. බටහිර භෞතික විද්‍යාව අද මෙතරම් වර්ධනය වී ඇත්තේ සෛද්ධාන්තික භෞතික විද්‍යාඥයන් ද හේතුකොට ගෙන ය. නිව්ටන් පඬිවරයා බටහිර සෛද්ධාන්තික (ගණිතමය) භෞතික විද්‍යාවකට  පදනම දැමීම ය. (ලංකාවේ බටහිර ගණිතමය භෞතික විද්‍යාව - මැතමැටිකල් ෆිසික්ස් - පිළිබඳ විශේෂ උපාධිය ලබාගත හැකි එකම විශ්වවිද්‍යාලය කැලණිය විශ්වවිද්‍යාලය වෙයි) අයින්ස්ටයින් පඬිවරයා චිත්ත පරීක්ෂණ (තෝට් එක්ස්පෙරිමන්ට්) යන සංකල්පය බටහිර භෞතික විද්‍යාවට හඳුන්වා දුන්නේ ය. චිත්ත පරීක්ෂණ (නිරීක්ෂණ- තෝට් ඔබ්සර්වේෂන්ස්- ) ගැන කතාකරන සෛද්ධාන්තික ඉතිහාසඥයන් ඉතිහාසයට ආලෝකයක් හා අනාගතයක් සපයනු ඇත.

රාජ්‍යය ගෙනයෑම සංකල්පය සිංහලයන් තේරුම්ගත් ආකාරය තවත් පැහැදිලි කරගැනීමට විමලධර්මසූරිය රජුගේ ක්‍රියා කලාපය හැදෑරිය හැකි ය. ඔහු සීතාවක රාජසිංහ රජුගේ සමකාලිකයෙක් විය. පෘතුගීසීන්ගේ පැමිණීමෙන් පසු සිංහලය හෙවත් සිංහලේ කුඩා විය. පෘතුගීසීහු මුහුදුබඩ පෙදෙස් පාලනය කළහ. (යාපන ප්‍රන්තයේ රජු නෙවත් ඈපා පෘතුගීසීන්ට යටත්වීමෙන් පසුව එහි තිබුයේ පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතානි පාලන යන්ත්‍රයකි.) ඉතිරි වී තිබුණු සිංහලයේ රජු ලෙස කටයුතු කෙළේ සීතාවක රාජසිංහ රජු ය. එහෙත් දොන් ජුවන් ධර්මපාල කෝට්ටේ නාමික ව හෝ සිටීම රාජසිංහ රජු සිංහලයේ රජු ලෙස පිළිගනු ලැබීමට බාධාවක් විය. දොන් ජුවන් ධර්මපාල කොළඹ කොටුවේ රැකවරණ ලැබීමෙන් පසු තත්වය වෙනස් විය. සංක්‍රමණීය කාලයකට යටත්වුව ද කොනප්පු බණ්ඩාර විමලධර්මසූරිය නමින් රජවූවා පමණක් නොව රාජ්‍යය සෙංකඩගලපුරයට ගෙනගියේ ය. ඒ අගනුවර හෙවත් මහනුවර විය. මේ රාජ්‍යය 1815 දක්වා තිබුණි. විමලධර්මසූරිය රජු සිංහලේ රජු ලෙස පිළිගැණුන ද සීතාවක රාජසිංහ රජු එලෙස නො පිළිගැණුනේ දොන් ජුවන් ධර්මපාල නාමික ව හෝ කෝට්ටේ රජ කළ බැවිනි. කෝට්ටේ රාජ්‍යය සමස්ත සිංහලයේ ම අවසාන රාජධානිය විය. සිංහලයේ කොටසක් පෘතුගීසින් අල්ලාගැනීමෙන් පසු කෝට්ටේ රාජ්‍යයෙන් කොටසක් දොන් ජුවන් ධර්මපාල සමග කොළඹට ගෙනයන ලදී. සිංහලයේ ඉතිරි කොටසේ රාජ්‍යය විමලධර්මසූරිය රජු විසින් සෙංකඩගලපුරයට ගෙන යන ලදී.    (මතු සම්බන්ධයි)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva